www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රවීන්ද්‍රනාදන් සෙන්දිල් රවී

## *1969 ඔක්තෝබර් 12-2007 පෙබරවාරි 28*

**Raveenthiranathan Senthil Ravee**
**October 12, 1969-February 28, 2007**

### 2007 මාර්තු 07

ලන්ඩනයෙහි පදිංචි ජාත්‍යන්තර කමිටුවේ සාමාජිකයෙකු වූ රවීන්ද්‍රනාදන් සෙන්දිල් රවී (සෙන්දිල්) පසු ගිය පෙබරවාරි 28 වන දා අලුයම් යාමයෙහි මෝටර් රථ අනතුරකින් ජීවිතක්ෂයට පත් විය. අනතුර සිදු වූයේ ලන්ඩනය කරා දිවෙන "එම්20" රථ මාර්ගයේ දී ය. සිය බිරිඳ වූ අන්පරාසි ද තුර්ෂින්, අජාන් හා බිළිඳු ලියොන් යන දරු තිදෙනා ද අතැර හේ අවසන් ගමන් ගියේ ය.

මෙම මරනයත් සමග සෙන්දිල්ගේ පවුලට අත් වූ වියෝව පිලිබඳව හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව එම පවුලේ සාමාජිකයන් වෙත සිය සාතිශය සංවේගය පල කර සිටී. හේ දයාබර ස්වාමිපුරුෂයෙක් විය. ආදරබර පියෙක් විය. සිය දරුවන් පිලිබඳව බලගතු අභිමානයකින් යුතු වූයේ ය. පන්ති පීඩනය අවසන් කිරීම මගින් ඔවුන්ට වඩා හොඳ ජීවිතයක් හිමි වනු ඇතැයි නිශ්චය කොට ගෙන සිටියේ ය.

සෙන්දිල් උපත ලද්දේ 1969 ඔක්තෝබර් 12 වන දා ශ්‍රී ලංකාවේ යාපනයෙහි ය. පැබ්ලෝවාදී සංශෝධනවාදයේ දියකරහැරීම්වාදී දේශපාලනය එහි තාර්කික නිගමනය කරා ගෙන ගොස් 1964 දී බන්ඩාරනායක මැතිනියගේ ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආන්ඩුවට එක් වෙමින් ලංකා සමසමාජ පක්ෂය (ලසසප) කල පාවා දීම උදෙසා දැවැන්ත වන්දියක් ගෙවන්නට සිදු වූ පරපුරට හේ අයත් විය.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව තුළ හතර වන ජාත්‍යන්තරය ගොඩ නැගීම උදෙසා පූර්වයෙහි කර තිබූ අරගලය හේතු කොට ගෙන ලසසපය දැවැන්ත දේශපාලනික අධිකාරයක් භුක්ති විඳි අතර, සිංහල හා දෙමල ජනතාවගේ එකමුතුවට පක්ෂව එය තනිව නැගී සිට තිබුනි. මේ හේතුව නිසා, ජාතික පීඩනයෙන් තමන්ගේ ම විමුක්තිය සලසා ගැනීමේ උපකරනය ලෙස සලකා දෙමල ජනතාව කම්කරු පන්තිය හා එහි විප්ලවවාදී පක්ෂය කෙරෙහි බලාපොරොත්තු රඳවා තිබුනි. එහෙත් ඒ වෙනුවට ලසසපය ශ්‍රී ලාංකික රාජ්‍යය ආරක්ෂා කිරීමේ වගකීම භාර ගත්තා පමනක් නො ව දෙමල විරෝධී වර්ගවාදය ආයතනගත කල ව්‍යවස්ථාවකට එකඟත්වය පල කලේ ය.

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වූත් වත්මන් සමාජවාදී සමානතා පක්ෂයේ පෙරගමන්කරු වූත් විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ගොඩ නැගීමට පෙරට ගිය විප්ලවවාදීහු මෙම පාවා දීමට විරුද්ධ වූහ. එසේ වුව ද, සමාජවාදී ඉදිරි දර්ශනය පිලිබඳ විශ්වාසයට යටි වල කපමින් ද දෙමල හා සිංහල ජන කොටස් දෙක අතර ම සුලු ධනේශ්වර ජාතිකවාදී සංවිධානවල වැඩීමට පහසුකම් සපයමින් ද එම පාවා දීම කම්කරු පන්තියේ දේශපාලනික වර්ධනය කෙරෙහි කල් පවත්නා බලපෑමක් ඇති කලේ ය.

සෙන්දිල්ගේ දේශපාලන වර්ධනය වටහා ගත හැක්කේ මේ සන්දර්භය තුල පමනකි. වැඩි වශයෙන් දෙමල ජනයා රැකියාවල නියුක්තව සිටි වතුකරයෙහි ප්‍රදේශවල ඔහුගේ දෙමාපියෝ ගුරුවරුන් ලෙස සේවය කලහ. දෙමල ජනයා මුහුන දෙන සූරා කෑමේ හා වර්ගවාදයේ දරුනු මට්ටම එහි දී ඔහු සෘජුව ම දැක ගත්තේ ය.

15 හැවිරිදි වියේ දී, ලේ වැකි දෙමල විරෝධී ජනඝාතනවලින් අනතුරුව එළඹි සමයෙහි දී සෙන්දිල් ඊලම් විප්ලවවාදී ශිෂ්‍ය සංවිධානයට (ඊරෝස්) එක් විය. අනෙකුත් ජාතිකවාදී සංවිධානවලට වෙනස් ලෙසින්, මෙම කන්ඩායම තමන් සමාජවාදී ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කරන බවත් කම්කරු පන්තිය නියෝජනය කරන බවත් කියා සිටියහ. වතු කම්කරුවන්, වෙන ම දෙමල රාජ්‍යයක්, එනම් දෙමල ඊලම ගොඩ නැගීම සඳහා ගෙන යන අරගලයෙහි කේන්ද්‍රීය සාධකයක් යැයි එම සංවිධානය සඳහන් කලේ ය.

ඔහු දේශපාලනිකව ක්‍රියාකාරී වී යන්තම් තුන් වසරකට පසුව, එනම් 1987 දී ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කෙරුනි. මේ වනාහි තමිල් නාඩු ප්‍රධාන භූමි ප්‍රදේශයෙහි ඉන්දියානු ධනේශ්වරයේ අවශ්‍යතාවන්ට තර්ජනයක් වූ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පැතිර පැවති ජාතිකවාදී කැරැල්ල අවසානයකට ගෙන එනු වස් ආන්ඩු දෙක ම එක්ව දරන ලද ප්‍රයත්නයක් වූයේ ය.

සීමිත ස්වාධීනත්වය පිළිබඳව ගිවිසුමේ ඇතුලත් වූ පොරොන්දු ස්වයං නිර්නය දෙසට තබන ලද පියවරක් යැයි ගෙන හැර පාමින් ප්‍රධාන ජාතිකවාදී කන්ඩායම වන දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය එයට අනුමැතිය සැපයී ය. කෙසේ වුව ද, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට ඉන්දියානු හමුදාව යැවීම සම්බන්ධයෙන් පුලුල්ව පැතිර ගිය විරෝධතාවක් පැවතුනි. එක් අතකින් ඉන්දියානු හමුදාව ද අනෙක් අතින් දෙමල ජාතිකවාදී සංවිධාන අතර පුපුරා ගිය එකිනෙකා මරා ගන්නා යුද්ධය ද අතර උගුලට දෙමල ජනතාව හසු කෙරුනු ලේ වැකි ගැටුමක් හට ගැනුනි.

1991 ආරම්භයේ දී ඉන්දියානු හමුදා ඉවත් කර ගැනීමෙන් අනතුරුව කැනඩාවෙහි හා යුරෝපා රටවල දේශපාලනික රැකවරන සොයා දහස් ගනන් තරුනයෝ ශ්‍රී ලංකාව හැර ගියහ. මෙම ජන සමූහය අතර සිටි සෙන්දිල් 1991 අගෝස්තුවේ දී පැරිසියට ලඟා විය. ඊරෝස් සංවිධානය සම්බන්ධයෙන් පැවති මූලාවන්ගෙන් අත්මිදුනු ඔහු නව දේශපාලන සංවිධානයක් ගොඩ නැගීම පිළිබඳව පිටුවාහලේ සිටි අනෙකුත් පිරිස් සමග සාකච්ඡාවන්ට සම්බන්ධ විය. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සහායකයන් සමග ඔහු මුලින් ම සබඳතා ගොඩ නගා ගත්තේ මේ කාල පරිච්ඡේදය අතරතුර දී ය.

ලසසප පාවා දීමේ අර්ථභාරය කුමක් ද යන්න පමනක් නො ව, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය ආරක්ෂා කිරීමට හා ජාතික බෙදුම්වාදයට විරුද්ධව සිංහල හා දෙමල කම්කරු පන්තියේ සමාජවාදී එකමුතුව වර්ධනය කිරීමට සම්බන්ධිතව එම පාවා දීමට එරෙහිව විකොස ගෙන ගිය සප්‍රතිපත්තික අරගලය ද වටහා ගැනීම සඳහා පලමු අවස්ථාව ඔහු වෙත සම්පාදනය වූයේ මෙමගිනි.

සෙන්දිල් ශ්‍රී ලංකාවට අදාල මෙම පාඩම් උකහා ගත්තා පමනක් නො වේ. හේ කැප වීමෙන් යුතු ජාත්‍යන්තරවාදියෙකු හා ලෝක සමාජවාදයේ සටන්කරුවකු බවටත් පත් විය.

1994 දී ඔහු හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට එක් වූ මොහොතේ පටන්, පිටුවාහලේ සිටි දෙමල ජනයා අතර එහි ආනුභාවය වර්ධනය කර ලීම පිනිස දැරූ උත්සාහයේ දී සෙන්දිල් වෙහෙස නො තකා වැඩ කලේ ය. එහෙත් ඔහු කිසි දා යුරෝපා කම්කරු පන්තිය තුල කල දේශපාලනික මැදිහත් වීම් බැහැර කලේ නැත. 2000 දී *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* දෙමල භාෂා අංශය දියත් කෙරුනු විට ඔහු එය වැලඳ ගත්තේ ඉන්දියානු උපමහාද්වීපය තුල හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩ නැගීමෙහි ලා තීරනාත්මක වන උපකරනයක් ලෙස සලකමිනි.

යුරෝපයෙහි දිවි ගෙවමින් සෙන්දිල් වර්ගවාදී අන පනත්වල බලපෑමට මුහුන දුන්නා පමනක් නො වේ. සංක්‍රමනික කම්කරුවන් විෂයෙහි දරුනු ලෙස බලපෑ විනාශකාරී කොන්දේසි දරා ගැනීමට ද ඔහුට බල කෙරුනි.

සෙන්දිල් මිය ගියේ සරනාගතයෙකු ලෙස දිවි ගෙවීමට සිය සොහොයුරියට ඇති අයිතිය ආරක්ෂා කර ගැනීමේ පරිශ්‍රමයක් වෙනුවෙන් පැරිසියට ගොස් අලුයම් යාමයෙහි ආපසු එමින් සිටිය දී ය යන්න නොවැදගත් කරුනක් නො වේ.

වෘත්තීමය සුදුසුකමකින් තොරව සිටි සෙන්දිල්ට අඩු වැටුප් ගෙවන නුපුහුනු රැකියා ගනනාවක යෙදී සිය පවුල උදෙසා ජීවිකාවක් සරි කර ගැනීමට බල කෙරුනි. මෙම කරුන හේතු කොට ගෙන ඊලඟ 12 වසර පුරා ප්‍රන්සයේ සිට බ්‍රිතාන්‍යයට දෙවරක් ම සංක්‍රමනය වීමට ඔහුට සිදු විය. රැකියාවල යෙදීමට අමතරව, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සිය හැකියාව වැඩි දියුනු කර ගැනීම සඳහා සෙන්දිල් විශේෂ අභිලාෂයකින් යුතුව කටයුතු කරමින් සිටියේ ය. ඉන්දියාවෙහි දේශපාලන වැඩ කටයුතු වර්ධනය කරනු පිනිස එය අත්‍යවශ්‍ය වන්නේ යැයි හේ සැලකී ය.

බොහෝ විට යමෙකුගේ ජීවිතයේ වටිනාකම හා අර්ථභාරය පිළිබඳව සලකා බැලීමෙහි ලා හොඳම මිනුම වන්නේ ඔහු අනෙකුන් කෙරෙහි ඇති කල බලපෑම ය. සෙන්දිල් සම්බන්ධයෙන් ගත් විට, ඔහුගේ මරනය විසින් පැන නංවා තිබෙන බරපතල ශෝකය ඔහු විශිෂ්ට මිනිසෙකු වී ය යන්නට සාක්ෂ්‍යයක් වේ.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත එවන ලද මතක සටහන් ගනනාවකින් ම බලගතු අවබෝධයකින් හා දයානුකම්පාවකින් හෙබි මිනිසෙකු පිළිබඳ සිතුවමක් නිර්මානය කෙරෙයි.

ටෝනි රොබ්සන් හා ටානියා කෙන්ට් මෙසේ ලියයිඃ

"සෙන්දිල්ගේ අතිශය සිත් ගන්නාසුලු ලක්ෂනය වූයේ දේශපාලනය, ඉතිහාසය හෝ ඉංග්‍රීසි භාෂාව ප්‍රගුන කිරීම සම්බන්ධයෙන් වේවා උගෙනීමට ඔහු තුල තිබූ බලගතු කැමැත්ත යි.

"ශාඛා රැස්වීම්වල දී මුලු හදින් ම ඒවාට සහභාගි වීමට ඔහු හැම විට ම උත්සාහ දරයි. තමන්ට සැක සහිත යම් කරුනක් පැවතිනි නම් ඔහු ඒ බව එලිපිට කියා පායි. තමන් කියන දෙය අන් අයට අවබෝධ කර ලීමේත් අනෙකුන් කියන දෙය තමන් අවබෝධ කර ගැනීමේත් අරමුනින් යුතුව ඉංග්‍රීසි භාෂාව පිළිබඳව තමන්ට පවතින සීමාසහිතකම් ජය ගැනීමට ඔහු මහත් සේ පරිශ්‍රම දරයි. හැම විට ම ප්‍රියමනාප හා සෙනෙහෙබර වූ හාසයට බර දඟකාර බවක් සමග මෙම ජව සම්පන්න බව ඇඳා ගැනීමට ඔහු සමත් විය.

"නැගෙනහිරදිග ලන්ඩනයෙහි දිවි ගෙවීමෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ හදවතෙහි පැතිර පවතින පන්ති පරතරය මැනවින් වටහා ගැනීමට ඔහුට අවස්ථාව සැපයුනි. බ්‍රිතාන්‍යයෙහි වෙසෙන බොහෝ දෙමල ජාතිකයන් මෙන් ම ඔහු ද, බොහෝ විට පෙට්‍රල් පිරවුම් හල් සහායකයෙකු ලෙස, ඉවරයක් නැති වැඩවල යෙදෙමින්, අඩු වැටුපට දිගු පැය ගනනක් සේවය කලේ ය. ඔහු කැනින් ටවුන්හි පිරවුම් හලක සේවය කරමින් සිටිය දී, ප්‍රදේශයෙහි වෙසෙන එක වක් ඔහු වෙත පැමින සිය දරුවන්ට කෑමට දෙනු පිනිස නොමිලේ පාන් ගෙඩියක් ලබා දෙන්නැයි ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. සෙන්දිල් ඉන් සැබවින් ම කම්පනයට පත් විය.

"නව අභියෝගයන් භාර ගැනීමටත් සිය බුද්ධිමය තිම් වලලු පුලුල් කර ගැනීමටත් ඔහු නිරතුරුව සූදානමින් සිටියේ ය. මෙවැනි තත්ත්වයක් යටතේ කෙනෙකු මරනයට පත් වීම ඛේදජනක වන මුත් දෝතින් ම ජීවිතය බදා වැලඳ ගත් යන්තම් 37 හැවිරිදි සෙන්දිල් වැන්නෙකු සම්බන්ධයෙන් ගත් විට එය විශේෂයෙන් ම කුරිරු වන බවක් පෙනී යයි. ඔහුගේ මුහුනේ ඇඳී තිබූ එම දගකාර සිනාව සමගින් ඔහු හැම විට අප මතකයට නැගෙනු ඇත."

ඉංග්‍රීසි බස උගෙනිමින් සිටි මුල් සමයේ ලන්ඩනයේ දී ඔහුට මුල් වරට මුන ගැසී තිබූ ට්‍රෙවර් ජොන්සන් සෙන්දිල්ගේ දිගු කාලීන මිතුරෙක් විය:

"ඔහු දේශපාලනය බැරෑරුම්ව ගත් අතර ක්‍රමයෙන් ඒ පිලිබඳ විශ්වාසය වර්ධනය කර ගත්තේ ය. එනිසා ප්‍රධාන ගැටලු පිලිබඳව ඔහුට වඩා නිරතුරුව කතා කල හැකි විය.

"සෙන්දිල් තමන් ගැන වැඩිපුර කතා කරන වර්ගයේ මිනිසෙකු නො වී ය. බොහෝ ජයග්‍රහන ලද මුත් ඒවා පිලිබඳව කතාබහ කිරීමට ඔහු කැමති නො වී ය. 'මට ඒ ගැන බොහෝ දේ කියන්නට පුලුවන්, ඒත් ඔබට තේරෙනවා මා නොකියන්නේ මන්ද කියා....' යන්නක් කියැවෙන සුවිශේෂ පුංචි සිනහවක් ඔහුට තිබුනි.

"සෙන්දිල් මියැදුනේ ය යන්න අතිමහත් ඛේදවාචකයකි. ඔහු ජීවත් වූ සැටියට ම ඔහු මිය ගියේ ය යන කරුන, එනම් ඔහුගේ මිතුරන් හා සහෝදරවරුන් වෙනුවෙන් තමන්ට හැකි උපරිම දේ කිරීමට උත්සාහ කරමින් සිටි අතරතුර ඔහු මිය ගියේ ය යන කරුනෙන් යම් අස්වැසිල්ලක් ලැබීමට ඔහුගේ පවුලට පිලිවන් වෙතැයි මම අපේක්ෂා කරමි."

අපේ ප්‍රකාශ් සෙන්දිල් සමග එකට වැඩ කල ලෝක සමාජවාදී වෙබ් අඩවියට ප්‍රතිපදානයන් කරන දෙමල තරුනයෙකි. ඔහු සෙන්දිල්ගේ සමීප මිතුරෙක් විය. ඔහුගේ වදන්වලින් මෙය අවසන් කිරීම සුදුසු ය:

"සෙන්දිල් දෙමල භාෂා වෙබ් අඩවිය ගොඩ නැගීමේ වැඩ කටයුතුවල පන නල විය. හේ පරිවර්තන කටයුතු බොහොමයක් සිදු කලේ ය.

"2005 පටන්, ඉන්දියානු උපමහාද්වීපයෙහි ශාඛාවක් ගොඩ නැගීමට ඉඩ සැලසෙන පරිදි එම කලාපයෙහි සිදු වන සිද්ධීන් දේශපාලනිකව විශ්ලේෂනය කිරීමේ අපගේ වැඩ කටයුතු අපි පෙරට ගෙන විත් ඇත. අපි එක්ව නිරතුරුව සාකච්ඡා පැවැත්වීමු. අඩු ගනනේ සතියකට තෙවරක් වත් හමු වීමු. ලිවීමට පටන් ගන්නැයි මා උනන්දු කලේත් අපි ඉන්දියානු ඉතිහාසය අධ්‍යයනය කිරීමට පටන් ගනිමු යි යෝජනා කලේත් ඔහු යි.

ආදර්ශමත් සහෝදරයෙකු, මාක්ස්වාදී නායකයෙකු හා මග පෙන්වන්නෙකු යන මේ බොහෝ දේ මට අහිමි වී තිබේ. මා ලන්ඩනයට සංක්‍රමනය වූ තැන් පටන් මගේ වර්ධනයේ කොඳු නාරටිය වූයේ ඔහු යි. නිවසක් හා රැකියාවක් සොයා ගැනීමට මට උදව් වූ ඔහු සැලකිල්ලෙන් මා වර්ධනය කලේ ය.

සුව සේ සැතපෙනු මැන සෙන්දිල් සහෝදරය. ඔබගේ පවුල හා දරුමල්ලන් ද මතු යම් දිනෙක ලෝකය සමාජවාදය කරා ගෙන යන අරගලය සියතට ගනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් යුතුව අපි ඔවුන් රැක බලා ගන්නෙමු."

© www.wsws.org